



# ශ්‍රී ලංකාවේ පුළුල් ඩිජිටල් කෘෂි කාර්මික සංවර්ධනය (IDAT)







Supported by

BILL & MELINDA GATES foundation

pwc

ICTA ideas actioned
Information and Communication Technology Agency of Sri Lanka

Sarvodaya

## 1. පුළුල් ඩිජිටල් කෘෂි කාර්මික සංවර්තන උපාය මාර්ගය සම්බන්ධ දළ සටහන

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ඉවහල් වන පරිදි, පුළුල් ඩිජිටල් තාක්ෂණයෙන් පිරිපුන් රටක් බිහි කිරීමට නම්, සෑම ක්ෂේත්‍රයක් ම තාක්ෂණය හා අනුගත කිරීමේ අවශ්‍යතාව රජය විසින් පිළිගෙන තිබේ. මෙරට ආර්ථික හා සමාජයීය වශයෙන් සුවිශාල වැදගත්කමක් උසුලන ක්ෂේත්‍රය වන්නේ, කෘෂි කාර්මික ක්ෂේත්‍රයයි. එබැවින්, එම ක්ෂේත්‍රයේ උන්නතිය, සංවර්ධනය හා තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවය නිරතුරුව ඊට හිමි වේ. ඒ හේතුවෙන් රජය, ඩිජිටල් කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තාක්ෂණික නවෝත්පාදන අඛණ්ඩව සිදු කරමින් හා එම ක්ෂේත්‍රය නවීන තාක්ෂණය හා අනුගත කරමින් ආර්ථිකයට වඩාත් ඵලදායී වන ඩිජිටල් කෘෂි කාර්මික ක්ෂේත්‍රයක් බවට සංවර්තනය කිරීමට කටයුතු කරයි.

### 1.1. උපාය මාර්ගික දැක්ම

**දැක්ම: කෘෂි කාර්මික ප්‍රගතිය ළඟා කර ගැනීමේ අවස්ථා උදා කිරීම සහ ඩිජිටල් මැදිහත්වීම් මෙන්ම, සමස්ත කෘෂි කාර්මික ක්‍රියාවලිය ඔස්සේ ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම පිණිස, ඒකාබද්ධ කෘෂි දත්ත වෙත ප්‍රවේශ වීමට රජයට හැකියාව සැලසීම.**

### 1.2. උපාය මාර්ගයේ අරමුණ

- ආහාර සුරක්ෂිතතාව අරමුණු කරගත් ප්‍රතිපත්ති, වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම උදෙසා, දත්ත-පාදක කරගත් තීරණ ගැනීමට සහය සැලසීම
- ඉඩම්, ජලය හා කෘෂි ඇතුළු සම්පත්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. ඒ සඳහා වන යෙදවුම් තුළින් මෙන් ම, කෘෂිකාර්මික ජීවන චක්‍රය තුළින් දේශගුණික අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම
- වැඩිදියුණු කළ ඩිජිටල් යටිතල පහසුකම්, ඩිජිටල් සාක්ෂරතාවය මෙන් ම, ණය, රක්ෂණය, උපදේශන සේවා, පසු අස්වනු කළමනාකරණය ආදී ඩිජිටල් සේවා සැපයීම සඳහා වැඩි වශයෙන් ආයෝජනය කිරීමට පෙළඹවීම.
- තාක්‍ෂණය භාවිත කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා, කෘෂි වටිනාකම් දාමය (සමස්ත කෘෂි කාර්මික ක්‍රියාවලිය) හරහා ධාරිතා ප්‍රවර්ධනය
- අස්වැන්න වැඩි කිරීම සහ ජල කළමනාකරණය, පොහොර යෙදීම සහ පසෙහි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කෘෂි තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම.
- කෘෂි දත්තවල ගුණාත්මකභාවය, වලංගුභාවය, පෞද්ගලිකත්වය හා ආරක්ෂාව සහතික කරන අතරෙහි, කෘෂි කාර්මික ජාලය තුළ අන්තර් ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රමිතීන් අනුගමනය කිරීම සහ තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය කිරීම.
- කෘෂි කාර්මික පිළිවෙත් නවීකරණය කිරීම සහ දේශගුණික අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම පිණිස, දැරිය හැකි නවෝත්පාදන සහ ගෝලීය ඩිජිටල් කෘෂි කර්ම ආකෘති මෙරට ස්ථාපිත කිරීම.

### 1.3 උපාය මාර්ගය සඳහා වන සංවර්තන මූලධර්මය

**ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂි කාර්මීක සංවර්තනය- සංවර්තනය සඳහා වන මූල ධර්මය**



*මූලාශ්‍රය: පාර්ශවකරුවන්ගේ උපදෙස් හා PwC විග්‍රහය, 2023, අප්‍රේල්*

ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් අදාළ සාක්ෂි සහ දත්ත පදනම් කරගත් තීරණ ගැනීම අතිශයින් වැදගත් ලෙස සැලකෙන අතර, ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට, අයහපත් දේශගුණික බලපෑම්වලින් කෘෂි කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට මෙන් ම, සුදුසු තාක්‍ෂණය හා අනුගත වීමට, එලෙස සාක්ෂි දත්ත පදනම් කරගත් තීරණ ගැනීම, තීරණාත්මක ලෙස බලපාන සාධකයකි. එපමණක් නොව, එවැන්නක් රටක පිරිපුන් කෘෂි පාරිසරික පද්ධතියක් කරා සාධනීය සංවර්තනයකට ද මහ සලසයි. ඒ හේතුවෙන්, මෙරට තිරසර සහ පුළුල් කෘෂි කාර්මික සමෘද්ධියක් උදා කරලීමට ඉවහල් වන, එවැනි දත්ත පදනම් කරගත් තීරණ

ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට හැකියාව සැලසීම මෙහි අරමුණයි. එකී අරමුණ ඇතිව, පහත සඳහන් ප්‍රධාන විෂය අරමුණු ඔස්සේ වෙනස්කම්වලට අවතීර්ණ වන ඩිජිටල් කෘෂි කාර්මික පරිවර්තන උපාය මාර්ගයකට යොමු වීම අපේක්ෂාව වී තිබේ.

**පහත ප්‍රධාන විෂය අරමුණු ඔස්සේ මෙම උපාය මාර්ගය ගොඩ නැගේ:**

a) ප්‍රබල ‘දත්ත සහ තීරණ කළමනාකරණ පද්ධතියක්’ (DDMS) සැලසුම් කිරීම සහ සකස් කිරීම
b) මුල් විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා කෘෂි-දත්ත තාක්ෂණික නියමු ව්‍යාපෘති (Ag-data Technology Pilots) හඳුන්වා දීම
c) තාක්‍ෂණික ව්‍යාප්තිය සහතික කිරීම සඳහා කෘෂි-තාක්ෂණික පෝෂණ පාරිසරික පද්ධතිය (Ag Tech incubation ecosystem) ශක්තිමත් කිරීම
d) තාක්‍ෂණික ක්‍රමවේද ව්‍යාප්ත කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා ප්‍රවර්ධනය සිදු කිරීම

ඉහත සඳහන් කළ විෂය අරමුණු එකිනෙකට අනුපූරක වෙමින්, මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඩිජිටල් සංවර්තනය සඳහා අත්‍යවශ්‍ය සාධක ලෙස ක්‍රියා කරයි. තව ද, මෙම ඩිජිටල් සංවර්තනයෙන් අපේක්ෂිත බලපෑම සාක්ෂාත් කර ගැනීමට නම්, කාර්යක්ෂම ඩිජිටල් කෘෂි කාර්මික පාරිසරික ක්ෂේත්‍රයක් සඳහා හැකියාව සලසන, ප්‍රබල ඩිජිටල් යටිතල පහසුකම් මෙන් ම, ව්‍යාපාරික ක්‍රමවේදයක් තුළින් ද ඉහත යෝජිත විෂය අරමුණුවලට සහය දැක්විය යුතු වේ. ඒ සඳහා මැදිහත් වීම් සිදු කරන ආකාරය සහ අපේක්ෂිත අරමුණු සහ අපේක්ෂිත ක්ෂේත්‍රවල ප්‍රතිඵල ළඟා කර ගන්නා ආකාරය දක්වමින්, ඉහත වෙනස්කම් සිදු කිරීමට අදාළව න්‍යායක් ඉදිරිපත් කර ඇත.

## 2. පුළුල් ඩිජිටල් කෘෂි කාර්මික සංවර්තනය සඳහා ඉදිරි සැලසුම

මෙම IDAT උපාය මාර්ගය ඔස්සේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ඩිජිටල් සංවර්තනය සඳහා ධාවක වශයෙන් හඳුනාගෙන ඇති සාධක, මෙහි දී සංකල්පීය වශයෙන් දැක්වීම සඳහා '5-I' ප්‍රවේශය අනුගමනය කෙරේ. එමෙන් ම, ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය මඟින් පහත ඉදිරිපත් කර ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර, ඒවා ඉදිරියේ දී තවදුරටත් විස්තර කෙරේ.

**5I ප්‍රවේශයේ කුළුණු සහ අපේක්ෂා කරන ප්‍රධාන කොටස්**

| 1. තොරතුරු ආරක්ෂාව | 2. දත්ත ගොනුවෙහි අන්තර් ක්‍රියාකාරීත්වය | 3. යටිතල පහසුකම්වල ශක්තිමත් බව | 4. නවෝත්පාදන සහය | 5. ආයතනික පාලනය |
|---|---|---|---|---|
| දත්ත<br>• විවිධ ආයතන / ආයතන හරහා අදාළ දත්ත හඳුනා ගැනීම<br><br>දත්ත හුවමාරු ප්‍රොටොකෝල<br>• අවශ්‍ය දත්ත වර්ගීකරණය සහ හුවමාරු කළ හැකි යැයි සැලකෙන සියලුම තොරතුරු වෙත ප්‍රවේශය | **Tech-Stack**<br>විවිධ අමාත්‍යාංශ / නියෝජිතායතනවලින් කෘෂි හා අනුබද්ධ දත්ත සඳහා පොදු දත්ත ගබඩාව<br><br>තීරණ ආධාරක පද්ධතිය **(DSS)**<br>• දත්ත සහ සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීමට නිලධාරීන්ට පහසුකම් සලසන අන්තර්ජාල ක්‍රමවේදය | උපාංග<br>එකතු කිරීමේ, සංසන්දනය කිරීමේ, විශ්ලේෂණ හා පරිශීලක මට්ටම් වලින් අවශ්‍ය උපාංග වෙත ප්‍රවේශය<br><br>ගබඩා කිරීම සහ ප්‍රවේශය<br>ශක්තිමත් ජාල පහසුකම සමඟ **Cloud** හා **server** වෙත ප්‍රවේශය | කෘෂි- තාක්ෂණික නියමු ව්‍යාපෘති<br>• DSS ක්ෂණික සහය සක්‍රිය කිරීම සඳහා සනාථ කළ විසඳුම් අනුගමනය කිරීම<br>• ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය ඉගෙනුම් වාතර්‍ා කිරීම, පරිමාණය තක්සේරු කිරීම<br>කෘෂි- තාක්ෂණික incubation පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම<br>• කෘෂි- තාක්ෂණික incubation පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහය | ධාරිතා ගොඩනැගීම<br>• DSS සහ DMS භාවිතය සහ තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ ධාරිතා ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කර තිබේ.<br>ඉහළ මට්ටමේ සහය<br>• ඉහළම මට්ටමේ නිලධාරීන්ගෙන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරී අංශවල විධිමත් සහය<br>අභිසාරීත්වය<br>• වෙනත් සමාන වැඩසටහන් සමඟ සහසම්බන්ධය |

## 2.1 තොරතුරු ආරක්ෂාව (Information security)

සීමිත විග්‍රහයන් පමණක් සිදු කෙරෙන දත්ත, ගුණාත්මකභාවය තහවුරු කෙරෙන ප්‍රබල ක්‍රමවේදයක් නොමැති දත්ත මෙන්ම, සංඛ්‍යාලේඛන සමඟ ඒකාබද්ධ නොවූ දත්ත, විවිධ අමාත්‍යාංශ අතර අන්‍යොන්‍ය සහයෝගිතා අවස්ථාවන්ට සීමා පමුණුවනු ලබයි. ඒ හේතුවෙන්, එක්රැස් කෙරෙන දත්ත හඳුනා ගැනීම හා දත්ත එක්රැස් කිරීම සඳහා වන යාන්ත්‍රණය (සියලු පාර්ශවකරුවන්ගේ අදහස් අනුව) අතිශයින් වැදගත් ය. එමඟින් දත්ත සංවේදීතාව, දත්තවල පරිමාණය, වැදගත්භාවය මෙන් ම, හිමිකාරිත්ව /සම්භවය ආදිය මත පදනම්ව, දත්ත වර්ගීකරණයට ලක් කිරීමට ඉඩකඩ සලසයි. ඒ අනුව, ජාතික දත්ත හුවමාරු ප්‍රතිපත්තිය මඟින් හා ශ්‍රී ලංකා රජයේ තොරතුරු වර්ගීකරණ රාමුව (SLGICF), මඟින් දැක්වෙන නියමයන්ට යටත්ව, දත්ත වර්ගීකරණයට ලක් කෙරේ. ඒ, හුවමාරු කළ හැකි දත්ත හා නොකළ හැකි දත්ත ලෙසිනි.

**දත්ත වර්ගීකරණය**




*මූලාශ්‍රය : **PWC** විග්‍රහය- **2023** අප්‍රේල්*

Tech-Stack සහ DSS පදනම් කරගත් ලිඛිත එකඟතාව / අවබෝධතා ගිවිසුම මත අමාත්‍යාංශ අතර, සංවේදී දත්ත හුවමාරු කර ගැනීම සිදු කෙරෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ ඩිජිටල් සංවර්තනය මෙහෙයවීම සඳහා වන ඉහළම නියෝජිතායතනය ලෙසින් ICTA විසින් IDAT උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායමේ ද සහාය ඇතිව ඉහත කී වර්ගීකරණය සිදු කරනු ඇත. තව ද, ශ්‍රී ලංකා රජය, රජයේ තොරතුරු පද්ධතිවල අන්තර් ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා විවෘත

ප්‍රමිතීන් මාලාවක් ලෙසින්, Lanka Interoperability Framework (LIFe) සකස් කර ඇති අතර, එමගින් තොරතුරු හුවමාරු කර ගැනීමට, බෙදා හදා ගැනීමට රාජ්‍ය ආයතනවලට මග පෙන්වනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ජාතික දත්ත හුවමාරු ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග ලේඛනයේ ඇති ප්‍රොටෝකෝල මගින් විවිධ අමාත්‍යාංශ සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර දත්ත හුවමාරු කර ගැනීම සඳහා මඟ පෙන්වීමක් සපයනු ඇත.

## 2.2 දත්ත පද්ධතියේ අන්තර් ක්‍රියාකාරිත්වය (Interoperability of databases)

කෘෂි කර්මාන්තයට අදාළ සමස්ත ක්‍රියාවලියෙහි අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම උදෙසා තිරසර ඩිජිටල්, අවකාශයක් ගොඩ නැගීමට නම්, ප්‍රතිපත්ති සම්පාදන හා අධීක්ෂණ ක්‍රියාවලියේ දී, දත්ත පාදක කරගත් තීරණ ගැනීමේ හැකියාව තිබිය යුතුය. ඒ සඳහා විවිධ රජයේ යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති ආශ්‍රිත දත්ත ඒකාබද්ධ කරන දත්ත කළමනාකරණ ක්‍රමවේදයක් (Tech-Stack) සහ තීරණ ආධාරක පද්ධතියක් (DSS) නිර්මාණය කිරීම මෙහිලා සිදු කෙරෙනු ඇත.

Tech-Stack යනු ගොවිපොළ, ගොවියා සහ බෝග මට්ටමෙන් තොරතුරු මෙන් ම, විවිධ යෝජනා ක්‍රම සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත් කෙරෙන දත්ත ගොනුව (database) කි. ඒ හැරුණු විට, විවිධ අමාත්‍යාංශ සහ අනාගත පාර්ශවකරුවන් (පෞද්ගලික තරගකරුවන්, ගොවීන්, ශාස්ත්‍රාලීය පිරිස) ද ඒකාබද්ධ කිරීමටද එය උපකාරී වනු ඇත. බහුවිධ මූලාශ්‍රවලින් ලබා ගන්නා වෙනස් දත්ත කට්ටල (datasets) එමඟින් සම්බන්ධ කර වර්ගීකරණයට ලක් කරමින් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට බඳුන් කෙරෙන අතර, එහි දී දත්ත ඒකාබද්ධ කෙරෙන්නේ ඩිජිටල් ආකාරයෙනි. සාමාන්‍යයෙන් Tech-Stack මඟින් සිදු කෙරෙන ක්‍රියාවලිය හා එහි අන්තර්ක්‍රියාකාරිත්වය පහත දළ ආකෘතිය මගින් දැක්වේ.

Tech-Stack සහ තීරණ ආධාරක පද්ධතිය (Decision Support System DSS)

**Tech-Stack පද්ධතිය**




- කෘෂි කර්මාන්තයේ /ග්‍රාමීය අවකාශය තුළ විවිධ පාර්ශවකරුවෝ කෘෂි තාක්ෂණික මූලාශ්‍ර ලෙසින් කටයුතු කරති.
- හඳුනා ගැනීමේ පහසුව සහ අවශ්‍යතාව අනුව තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා මූලාශ්‍ර දත්ත පුළුල් වශයෙන් විවිධ කාණ්ඩයන්ට වර්ග කර ඇත.
- පාර්ශවකරුවන්ගේ විවිධ හවුල් දත්ත සමුදායන් සමඟ සම්බන්ධිත, හරස්/විවෘත API, වෙබ් ලේඛනයක් තුළ ඒකාබද්ධ කෙරෙන දත්ත ක්‍රියාවලිය සිදු වේ.
- ඒකාබද්ධ කිරීමේ සහ දත්ත සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස, කෘෂි-දත්ත පාරිසරික පද්ධතිය මඟින් පාර්ශ්වකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා බහු දත්ත යෙදවුම් (Data Applications) ගොඩ නැගේ.

*මූලාශ්‍රය: PwC විග්‍රහය, 2023, අප්‍රේල්*

දත්ත හුවමාරු කර ගැනීම සහ දත්ත සඳහා ප්‍රවේශය මෙම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ දී, රජයේ පාර්ශවකරුවන්ට සීමා වේ. කෙසේ වෙතත්, සකස් කිරීමට නියමිත මෙම Tech-Stack ක්‍රමවේදය අනාගතයේ දී තරගකරුවන්, මූල්‍ය ආයතන, විද්වතුන්, ගොවීන් ආදී පාර්ශව ගණනාවක් සඳහා විවෘත පොදු දත්ත ගබඩාවක් ලෙසින් ක්‍රියාත්මක වේ. විවිධ (APIs සහ වෙනත් විකල්ප හරහා) පාර්ශවකරුවන්ගේ විශේෂිත දත්ත විශ්ලේෂණ ගණිත ක්‍රම සහ දෘශ්‍යකරණ (visualization) මඟින්, එනම්, Decision Support System මගින් දත්ත කට්ටල (datasets) වල Tech-Stack ඒකාබද්ධ කිරීම සිදු වේ. මෙහි දී, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, යෝජනා ක්‍රම සහ සේවාවන් ගණනාවක් පිළිබඳ එකම තැනකින් පුළුල් අවබෝධයක් සැපයීම පිණිස තීරණ ආධාරක පද්ධතිය (DSS) දැනට පවතින දත්ත කට්ටල / දත්ත සමුදායන් භාවිතා කරයි. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙසින් පරිශීලකයින්ට බුද්ධිමය මෙන් ම, භාවිතයට පහසු ඩිජිටල් අවකාශයක් මගින් අදාළ තොරතුරු දත්ත පුවරුවක (dashboard) ස්වරූපයෙන් දැක්වේ. විවිධ දෙපාර්තමේන්තුවලට විවිධ දත්ත පුවරු හරහා DSS මඟින් නිරන්තර ක්‍රියාවලි/ක්‍රමලේඛ අධීක්‍ෂණයෙන් සහ සමාලෝචනයෙන්, දත්ත මත පදනම් වූ සැලසුම්කරණ සහ සංවර්ධන කාර්යයන්ගෙන් මෙන් ම, ඵලදායී මූල හේතු විශ්ලේෂණයෙන් ද දෙපාර්තමේන්තුවට(වලට) සහාය සලසනු ඇත. ඒ, මැදිහත්වීම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට මෙන් ම, ගන්නා ලද ක්‍රියා මාර්ගවලින් කොතරම් දුරට බලපෑමක් සිදු වන්නේ දැයි මැනීම සඳහාය.

### DSS හි පරිශීලකයින්

i. **ජනාධිපති කාර්යාලය :** කෘෂි කර්ම අංශයට සම්බන්ධ ප්‍රධාන අමාත්‍යාංශ සඳහා සැලසුම් කර ඇති සියලුම ප්‍රතිඵල මගින් රට පුරා ඇති ප්‍රගතිය පිළිබඳ පුළුල් දැක්මක් ලබා ගැනීම
ii. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු නිලධාරීන්
   a) **අමාත්‍යාංශ ප්‍රධානීන්:** ප්‍රතිපත්ති සහ අයවැය තීරණ සැලසුම් කිරීමේ මූලික අරමුණ ඇතිව ප්‍රධාන ප්‍රමුඛතා ක්ෂේත්‍ර, යෝජනා ක්‍රම සහ සියලු පරිපාලන මට්ටම් හරහා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම.
   b) **දෙපාර්තමේන්තු ප්‍රධානීන්**: ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ සැලසුම් සහාය සඳහා සියලුම පරිපාලන කලාප හරහා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම.
   c) **පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්:** බිම් මට්ටමේ කාර්යයන්වල ප්‍රගතිය අවබෝධ කර ගැනීම සහ තම දිස්ත්‍රික්කවල සහ පළාත්වල වැඩි දියුණු වූ ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා නිවැරදිව පියවර ගැනීම

## 2.3 යටිතල පහසුකම්වල ප්‍රබලත්වය (Infrastructure Robustness)

ඕනෑම අංශයක ඩිජිටල් සංවර්ධනය දත්ත මත රඳා පවතින අතර, දත්තවල ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය එහිලා තීරණාත්මක සාධක වේ. එබැවින් Tech-Stack සහ Decision Support System ක්‍රමවේදය සකස් කිරීම සඳහා එම සාධක අවශ්‍ය වේ. වඩාත් නිවැරදිව සඳහන් කරන්නේ නම්, දැනට ශ්‍රී ලංකා රජය අදාළ අමාත්‍යාංශයන්හි දත්ත රැස් කිරීම සඳහා අනුගමනය කරන්නේ සම්ප්‍රදායික ක්‍රමවේදයකි. එනම්, ප්‍රධාන වශයෙන් අත්පොතක ස්වරූපයෙන් (තනි තනි විස්තර / තොරතුරු) අදාළ දෙපාර්තමේන්තු / ආයතනවල බිම් මට්ටමේ පුද්ගලයින් විසින් කඩදාසි ආකෘතිවලට පිරවීමෙන් දත්ත ගොනු කිරීම සිදු කෙරේ, පසුව ඩිජිටල් ආකෘති බවට සංවර්තනය වන්නේ මෙම තොරතුරු ය. මෙම ක්‍රමවේදයෙන් බැහැරව සමාන, නිවැරදි හා පැහැදිලි දත්ත Tech-Stack ක්‍රමවේදයෙන් ගොනු කිරීම සහතික කිරීමට දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ද ඩිජිටල්කරණය කිරීම අවශ්‍ය වේ. මෙම කාර්යය ඔස්සේ ඵලදායි ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා Tech-Stack හා DSS සඳහා සකස් කර ක්‍රියාත්මක වන ශක්තිමත් දෘඩාංගවලින් යුත් උපාංග භාවිත කිරීම අවශ්‍ය වේ.

**යටිතල පහසුකම් අවශ්‍යතා**




*මූලාශ්‍රය: පාර්ශවකරුවන්ගේ උපදේශන සහ PwC විශ්ලේෂණය*

## 2.4 නවෝත්පාදන සහාය (Innovation support)

### a) කෘෂි- තාක්ෂණික Incubation පාරිසරික පද්ධතිය ශක්තිමත් කිරීම

රට තුළ තරගකාරී දේශීය කෘෂි තාක්‍ෂණික අංශයක් නිර්මාණය කිරීමට නම්, නව්‍ය ව්‍යවසායන් ආරම්භ කිරීමට හා ඒවා වර්ධනය කිරීමට හැකි අන්දමේ ඵලදායි නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව ක්‍රමවේදයක් අවශ්‍ය වේ. දේශීය තාක්‍ෂණික ධාරිතාව ප්‍රවර්ධනය, පවතින සැබෑ තත්ත්වයට අදාළව කරුණු පරීක්‍ෂා කිරීම, පෞද්ගලික අංශය සහ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතන සමග සහයෝගයෙන් ආයෝජන මෙහෙයවීම යනාදී ක්ෂේත්‍රවල කෘෂි-තාක්ෂණය පදනම් කරගත් නව ව්‍යවසායන් සඳහා incubator සහය පිරිනමනු ලැබේ. Incubator, තාක්‍ෂණික හුවමාරුව මෙන් ම, නවෝත්පාදන සහ තාක්ෂණික භාවිතය තුළින් ප්‍රගතිය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කිරීම, කුඩා ව්‍යාපාර සංවර්ධනය සඳහා ආර්ථික සංවර්ධන උපාය මාර්ග වෙනුවෙන් සහාය වීම සහ දේශීය ආර්ථිකයන්හි වර්ධනය දිරිමත් කිරීම ආදිය සඳහා වන යාන්ත්‍රණයක් සකස් කිරීම මෙම incubation පද්ධතිය මගින් සිදු කෙරේ. එම අරමුණු සපුරා ගැනීම පිණිස, වසර 3 ක් සඳහා පූර්ව ලියාපදිංචි තක්සේරු සහාය දීර්ඝ කිරීමෙන් අනතුරුව, අදාළ කෘෂිකර්ම පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ නියෝජිතායතන වෙත කෘෂි තාක්ෂණික incubator හුවමාරුව සිදු කරනු ලැබේ.

### b) ගෝලීය වශයෙන් ස්ථාපිත කෘෂි තාක්ෂණික ආකෘතිවලින් දැනුම ලබා ගැනීම

රට තුළ රාජ්‍ය මට්ටමින් දත්ත පදනම් කරගත් තීරණ ආධාරක පද්ධති සකස් කිරීම මෙන් ම, කුඩා වතු හිමියන්ගේ මට්ටමෙන් ඩිජිටල් ගොවිතැන් සේවා හරහා කෘෂි කාර්මික තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු ආයෝජන සිදු කර තිබේ. ඒ අනුව, තෝරාගත් කෘෂි තාක්‍ෂණික නවෝත්පාදන කරා මෙහෙයවීම ඵලදායි ප්‍රවේශයකි. එවැනි ප්‍රවේශයක් ආර්ථික හැකියාව, පවතින අවදානම, තාක්‍ෂණය සඳහා අවශ්‍ය සම්පත්, මෙන් ම, දේශීය වශයෙන් යෙදවුම් ලබා ගැනීම, හා දේශීය වශයෙන් තාක්ෂණයේ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා වන යාන්ත්‍රණය සකස් කිරීම ඇතුළු තාක්‍ෂණික මැදිහත්වීම්වල බිම් මට්ටමේ කාර්යක්ෂමතාව පළමුවෙන් තක්සේරු කිරීමට ද ඉවහල් වේ, එනම්, බිම් මට්ටමේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීමේ පුරෝගාමියා ය.



වර්තමාන සන්දර්භය හමුවේ, රට තුළ විදෙස් සංචිත ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් වන අතරෙහි, රටේ ආහාර සුරක්ෂිතතාව ද සහතික කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව විසින් මූලික වශයෙන් ප්‍රමුඛතාව ලබා දිය යුතු වෙයි. එබැවින්, වී වගාවට අදාළව සම්පත් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නිවැරදි කෘෂි කර්මාන්තය, ඒ ඒ ප්‍රදේශ සඳහා විශේෂිත පෝෂක කළමනාකරණය හා දේශගුණයට සරිලන සහල් වර්ග තෝරා ගැනීම වැනි සාර්ථක තාක්ෂණික කාරණා කෙරෙහි කෘෂි ක්ෂේත්‍රය මෙහෙයවීම වැදගත් වේ.

පවතින තත්ත්වය හමුවේ මෙරටට රැකියා උත්පාදනය සේ ම, හොඳ විදේශ විනිමයක් ද ගෙන දීම සඳහා ද දායක වන ක්ෂේත්‍රය වන්නේ තේ නිෂ්පාදන ක්ෂේත්‍රයයි. මේ වන විට ලොව පුරා ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ වර්ධනය වන ගැටලු හමුවේ ජාත්‍යන්තර කෘෂි නිෂ්පාදන වෙළෙඳපොළ තුළ පිරිසිදු බව හා සෞඛ්‍යාරක්ෂිත බව සම්බන්ධ ප්‍රමිතීන්ට සුවිශාල වැදගත්කමක් හිමි වන අතර, තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ද එය එක සේ වලංගු වේ. ඒ හේතුවෙන් ආරම්භයේ සිට අවසානය දක්වාම අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව සේ ම, අමුද්‍රව්‍ය හා නිෂ්පාදනය පිළිබඳව සියලු කරුණු සොයා බැලීමේ හැකියාව සැලසීම ආදී සාර්ථක මැදිහත්වීම් මගින් වැඩි වෙළෙඳපොළ ප්‍රවේශයක් මෙන් ම, නිෂ්පාදන සඳහා ඉහළ මිල ගණන් ද ලබා ගැනීමේ අවස්ථාව පවතී.

### c) ශ්‍රී ලංකාවේ කෘෂි-තාක්ෂණික අංශය දියුණු කිරීමට පෞද්ගලික අංශය සහභාගි කර ගැනීම සඳහා පෙළඹවීම.

කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තාක්‍ෂණික දියුණුව වෙනුවෙන් පෞද්ගලික අංශය විසින් සැලකිය යුතු කාර්යයන් සිදු කරනු ලැබේ. එසේ වුවත්, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය (PPPs) සහ කර්මාන්ත තාක්ෂණ-පර්යේෂණ ආයතනයන්හි සබඳතා හරහා පෞද්ගලික අංශයේ සුවිශාල සහභාගිත්වය හිමිවන පරිදි, කෘෂි කාර්මික පාරිසරික පද්ධතිය තවදුරටත් විවෘත කිරීම සිදු කළ යුතු වේ. එවැනි සහයෝගිතාවයක් ඔස්සේ, දත්ත අභියෝගය ජය ගැනීමට පහසුකම් සැලසීමට මෙන් ම, තොරතුරු උත්පාදනය හා භාවිතය සඳහා පොදු ස්ථානයක් ලෙසින් ක්‍රියා කළ හැකි දත්ත ගබඩා ගොඩනැගිය හැකිය. එමෙන් ම, දේශීය කාර්යක්ෂම ගොවිතැන් ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා කෘෂි කර්මාන්තය හා බැඳී පවතින ලොව වෙනත් තාක්ෂණ ක්‍රම අධ්‍යයනය කරමින් දේශීය පිළිවෙත් දිරිමත් කිරීම හා තාක්‍ෂණික අත්හදා බැලීම් සිදු කිරීම ඉතා වැදගත් වේ. එමගින්, කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අදාළ ඩිජිටල් ව්‍යාපාර, රටේ නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව අංශ මෙන් ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSMEs) පෝෂණය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට, ඒවාහි වෙළෙඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට ඉඩ සැලසෙන අතර, සුළු

ජන කොටස් සහ ප්‍රදේශ ඒකාබද්ධ කිරීමට, සම්පත් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ (වඩා හොඳ) රැකියා අවස්ථා උත්පාදනය කිරීමට රටට සුවිශේෂී අවස්ථාවක් සැලසේ.

## 2.5 ආයතනික පාලනය (Institutional governance)

### a) IDAT උපාය මාර්ගය සඳහා පාලන ව්‍යුහය (Governance structure for IDAT Strategy)

රට තුළ ඵලදායී සහයෝගීතාව සඳහා හැකියාව සැලසීම, ක්ෂේත්‍රයට අදාළ ඩිජිටල් තාක්‍ෂණ ක්‍රම උපයෝගී කර ගැනීම සහ සාක්ෂි පාදක කරගත් තීරණ ගැනීම සඳහා ඩිජිටල් ශක්තිය සැපයීම පිණිස, විවිධ කෘෂි පාරිසරික පද්ධති එක් කෙරෙන, කාර්යක්ෂම පාලන ව්‍යුහයක් ස්ථාපිත කළ යුතුය.




**මෙහෙයුම් කමිටුව:** සමස්ත උපාය මාර්ගික මාර්ගෝපදේශ සැපයීම සහ පුළුල් ඩිජිටල් කෘෂි කාර්මික සංවර්තන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ 7 (එනම්, කෘෂි කර්ම අමාත්‍යාංශය, වාරි මාර්ග අමාත්‍යාංශය, වැවිලි අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය) නියෝජනය වන පරිදි මෙම මෙහෙයුම් කමිටුව පිහිටුවා තිබේ. එමෙන් ම, ශ්‍රී ලංකා රජය විසින් පවත්නා යාන්ත්‍රණ සහ නව යාන්ත්‍රණ හරහා සමස්ත පාලන සහය ඊට ලබා දෙන අතර ම, දැනුම බෙදාගැනීම, සම කැඳවීම්, ප්‍රධාන මූලාරම්භයන් සඳහා සම අරමුදල් සැපයීම ආදිය සඳහා ඉහත කී අමාත්‍යාංශ හත අතර අත්සන් එකඟතා ගිවිසුමක් ද සකස් කර තිබේ.

**කෘත්‍යාධිකාරී මණ්ඩලය:** මෙහෙයුම් කමිටුවට අමතරව, ආයතනික පාලන ව්‍යුහය අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ක්ෂේත්‍ර විශේෂඥයින්, පෞද්ගලික අංශය, යනාදියෙහි නියෝජනයෙන් යුත් කෘත්‍යාධිකාරී මණ්ඩලයක් ද පවතී. එම කෘත්‍යාධිකාරී මණ්ඩලය මෙහෙයුම් කමිටුවේ මඟ පෙන්වීම අනුව කටයුතු කළ යුතු අතර, උපාය මාර්ගික කාරණාවන්ට අදාළව විධායක කළමනාකරණය සඳහා වගකිව යුතු වන්නේ මෙම කෘත්‍යාධිකාරී මණ්ඩලයයි.

### b) ධාරිතාව වැඩි දියුණු කිරීම (Capacity Enhancement)

ඩිජිටල් තාක්‍ෂණය පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සඳහා DSS භාවිතය ආරක්ෂා කිරීම සහ DMS හි අරමුණු සාක්ෂාත් කර ගන්නා අතර ම, ප්‍රධාන පාර්ශවකරුවන් අතර කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය වේ. එබැවින්, තාක්‍ෂණික දියුණුව ශීඝ්‍ර ලෙස අත්පත් කර ගැනීම සඳහා කඩිනම් අවබෝධය සහ අනුගත වීම අවශ්‍ය වන බැවින්, රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වැඩිදියුණු කිරීමේ සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. **දත්ත** සහ තීරණ කළමනාකරණ පද්ධතිය (DDMS) සඳහා සකස් කරන ලද මෙවලම් පිළිබඳව, දත්ත රැස් කිරීම, විශ්ලේෂණ / වාර්තා හෝ වෙනත් ක්‍රියාකාරී පියවර සඳහා ඒවා භාවිතා කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් **සෑම තරාතිරමකම** රාජ්‍ය නිලධාරීන්ගේ දැනුවත්භාවය මෙන්ම, පුහුණුව අවශ්‍යම කාරණයකි**.** මෙම කරුණු සලකා, රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා ප්‍රවර්ධනය, DSS ක්‍රමවේදය අනුගත කිරීමේ ක්‍රියාවලියට අනුව අදියර වශයෙන් සිදු කෙරේ.

ඒ හැරුණු විට, දැනට පවත්නා ශ්‍රම බලකාය නිපුණතාවන්ගෙන් සන්නද්ධ කිරීමට පමණක් නොව, ඩිජිටල් කෘෂි තාක්ෂණික ක්‍රම අවබෝධ කර ගැනීම, ඒවා අගය කිරීම සහ ප්‍රයෝජනය ගැනීම සඳහා ක්ෂේත්‍රයට යොමුවන නවක පිරිස් සූදානම් කරන ඉදිරි සැලැස්මක් ද සකස් කළ යුතුව පවතී. එබැවින්, එලෙස ධාරිතා ප්‍රවර්ධනය සඳහා උනන්දු කිරීම හා අනුග්‍රහය දැක්වීම සඳහා අධ්‍යයන ආයතන, විශ්ව විද්‍යාල සහ ව්‍යාපාර සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම අවශ්‍ය වේ. මෙම පසුබිම තුළ, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් "ඩිජිටල් රාජ්‍ය නිපුණතා රාමුව" ලෙසින් වන සංකල්පීය ආකෘතියක් සකස් කර තිබේ.

වත්මන් අවශ්‍යතා තක්සේරු කිරීමට, සියලු පාලන මට්ටම්වල ධාරිතා අඩුපාඩු හඳුනා ගැනීමට සහ රැකියා සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය සඳහා පහසුකම් සැලසීමට එම ආකෘතිය ඉවහල් වේ. මේ සඳහා, හිමිකාරිත්වය, සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ ආකෘතීන්වලට අනුගත වීම සහතික කිරීම පිණිස, අදාළ අමාත්‍යාංශවල පවතින කාර්යයන් / යෝජනා ක්‍රම උපයෝගී කරගනු ලැබේ.

### c) අභිසාරී සහ අනුපූරක සහයෝගිතාවන් (Convergence and Complementation)

සාක්ෂි පාදක කරගත් බහු-ආංශික සහ බහු මට්ටමේ අභිසාරී (convergent) ප්‍රවේශයන්ට අනුකූලව, මෙම උපාය මාර්ගය ඔස්සේ, ඩිජිටල් කෘෂි කර්මාන්තයේ සැබෑ උපාය මාර්ගික වෙනස්කම් සඳහා පොදු අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් හවුල්කාරිත්වයන් හා සන්ධාන ගොඩනැගීම ඉලක්ක කෙරේ. වර්තමානයේ දී, තාක්ෂණය ප්‍රධාන කරගත් ක්ෂේත්‍රවලින් එකක් ලෙසින් කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ක්‍රියාත්මක කෙරෙන සමාන වැඩසටහන් ගණනාවක් පවතී. රාජ්‍ය ආයතන අතර අඛණ්ඩව සහයෝගීතාවයන් පවත්වාගෙන යාමේ දී, වැඩි දියුණු කළ අනුගත වීම් සහ වඩා හොඳ, එක් එක් අංශ විශේෂ කරගත් යෙදවීමක් වෙනුවෙන්, පොද්ගලික අංශයේ ක්‍රියාකාරිකයින් සම්බන්ධ කර ගැනීම ඉතාමත් වැදගත් වේ. යම් යම් කාර්යයන් වෙනුවෙන් වෙන් කිරීමට මූල්‍ය සම්පත් නොමැති රටක, සම්පත් භාවිතය කාර්යක්ෂම අයුරින් භාවිත කිරීමට හැකි පරිදි ඒකාබද්ධ ක්ෂේත්‍ර පිළිබඳ දැන ගැනීම සඳහා වන ප්‍රයත්නයන් අවශ්‍ය කෙරේ. එහි දී, දිරිමත් කෙරෙන්නේ නව ව්‍යුහයන් පිහිටුවීමකට වඩා, පවතින ආයතනික ව්‍යුහයන් අනුව කටයුතු කිරීමේ, ඒවාට අනුවර්තනය වීමේ සහ/ හෝ යම් යම් එක්කිරීම් සිදු කිරීමේ ක්‍රමවේදයකි. ක්‍රමලේඛන චක්‍රය හරහා මෙම අභිසාරීත්වය සහ අනුපූරක සහයෝගීතාවන් ළඟා කර ගත හැක.

### d) ස්ත්‍රී පුරුෂ සමාජභාවය අදහස් කෙරෙන ප්‍රවේශයක් සඳහා සහයෝගය දැක්වීම (Incorporating a Gender intentional approach)

ඩිජිටල් කෘෂි කාර්මික සංවර්තනයෙහි සැබෑ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් වන එක් ප්‍රධාන අංගයක් වන්නේ, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතා දුරලීමේ ප්‍රයත්නයක් ලෙසින් මෙම ඩිජිටල්කරණ ක්‍රියාවලිය මෙහෙයවීමයි. වර්තමානයේ පවතින සන්දර්භය තුළ සම්පත් සඳහා ප්‍රවේශය මෙන් ම, සම්පත් පාලනය අතින් ද කාන්තා පාර්ශවයේ දායකත්වය ඉතාමත් අල්ප ය. කාන්තාව, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ වාණිජ සහ සහ මධ්‍ය පරිමාණ කෘෂි අංශයන්ට සම්බන්ධ වීම ද ඉතා අඩුවෙන් සිදු වේ. එපමණක් නොව, සමස්ත කෘෂි කාර්මික ක්‍රියාවලියෙහි (වටිනාකම් දාමයන්) හා යැපුම් කෘෂි කර්මාන්තයෙහි ද කාන්තාවන්ගේ දායකත්වය ගණනය කර නොමැති

බැවින්, කෘෂි කර්මාන්තය තුළ කාන්තාවන් බහුලව දැකිය නොහැකි තරමය. ඩිජිටල් කෘෂි කාර්මික සංවර්තන සමස්ත පරාසය තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ආරම්භක ලක්ෂ්‍යය ලෙසින් කෘෂිකර්මාන්තයේ සහ ග්‍රාමීය අංශවල ස්ත්‍රී පුරුෂ පරතරය තීරණය කිරීම සඳහා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් දැක්වෙන තොරතුරු විරල ය.

## 3. IDAT ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම

IDAT උපාය මාර්ගය වසර තුනක (2023 - 2026) කාල සීමාවක් තුළ ක්‍රියාවට නැංවීමට නියමිත වන්නේ, ඉහත උප කොටසෙහි පිළිවෙළින් විස්තර කර දැක්වූ අංග සමඟිනි. මේ සඳහා නිදසුන් ලෙස ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පහත ඉදිරිපත් කර තිබේ.

| කාලරාමුව | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
|---|---|---|---|
| | • දත්ත හුවමාරු ප්‍රොටොකෝල<br>• Tech – Stack සහ DSS සඳහා දත්ත හුවමාරු ප්‍රොටොකෝල සකස් කිරීම සහ විධිමත් කිරීම<br>• තාක්ෂණික නියමු ව්‍යාපෘති<br>• තාක්ෂණික නියමු ව්‍යාපෘති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම | • Tech – Stack සහ DSS<br>• Tech – Stack සහ DSS සකස් කිරීම<br>• ධාරිතා ගොඩ නැගීම<br>• Tech – Stack සහ DSS සඳහා අනුගත වීමට රාජ්‍ය නිලධාරීන්/ පුද්ගලයින් තුළ ධාරිත වර්ධනය<br>• කෘෂි තාක්ෂණික incubator පාරිසරික පද්ධතිය ශක්තිමත් කිරීම<br>• පෞද්ගලික අංශයේ සහය ඇතිව කෘෂි තාක්ෂණික incubator පාරිසරික පද්ධතිය ©ICTA ක්‍රියාත්මක කිරීම | •දත්ත පදනමේ අන්තර් ක්‍රියාකාරීත්වය<br>•Tech – Stack සහ DSS හරහා අමාත්‍යාංශ/දෙපාතර්මේන්තු අතර දත්ත හුවමාරු කිරීම<br>•අභිසාරීබව (කේන්ද්‍රගත වීම)<br>•සමාන පරිසරය තුළ අනෙකුත් ව්‍යාපෘති/ මුලපිරීම සමග සහයෝගීතාව |
| | වසර 1 | වසර 2 | වසර 3 |

| මෙහෙයුම | බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම | ICTA | ශ්‍රී ලංකා රජය | IDAT ව්‍යාපෘති කණ්ඩායම |
|---|---|---|---|---|
| | IDAT උපාය මාගරික ක්‍රමවේදය සකස්කර ක්‍රියාත්මක කිරීමට, උපායමාගරික, මග පෙන්වීම සහ මූල්‍ය සහාය | IDAT උපාය මාගර් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමේ පහසුකම සඳහා GoSL වෙතින් පත්කළ නියෝජිතායතනය | IDAT උපාය මාගර්යේ හිමිකරු සහ සෘජු අවසාන ප්‍රතිලාභියා | IDAT උපාය මාගර්යෙහි හඳුනාගත් සංරචක ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම |

| අරමුදල් | බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම | ශ්‍රී ලංකා රජය | පෞද්ගලික අංශය | IDAs |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක කරන කණ්ඩායම හරහා IDAT උපාය මාගර්ය යටතේ හඳුනාගත් කොටස් සඳහා මූල්‍ය සහාය පිරි නැමීම | යටිතල පහසුකම්, දෘඩාංග, පවතින ක්‍රම/ මූල පිරීම් මගින් මෙහෙයුම් සහය පිරි නැමීම | අනාගත incubatees ගොඩ නැංවීමට කෘෂි තාක්ෂණික incubator ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය සහාය | පදනම් සහය සපුරාලීම සඳහා බහුපාශර්වික / ද්විපාශර්වික වැඩසටහන් වලින් සහය ලබා ගැනීම |

| අධීක්ෂණය | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක කරන කණ්ඩායම් විසින් වරින් වර සමස්ත හා සංරචක පාදක කරගත් වාර්තාකරණය | ප්‍රගති සමාලෝචනය, මඟ පෙන්වීම සහ පාඨමාලා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා සකස් කරන ලද කමිටු නිතිපතා රැස්වීම් | කාල නියමයන් සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ස්ථාවර වගකීම් සහිත විශේෂිත ක්‍රියාකාරකම් සහිත MIS ව්‍යාපෘති | සංරචක සඳහා අර්ථ දක්වා ඇති දර්ශක නිරීක්ෂණය කිරීමට ප්‍රතිඵල රාමුව ඔස්සේ ප්‍රගතිය තක්සේරු කිරීම |

මෙම උපාය මාර්ගය අවහිරයකින් තොරව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, සමස්ත කෘෂි කාර්මික ක්‍රියාවලිය (වටිනාකම් දාමය) තුළ, නිර්වචනය කරන ලද අදාළ කාර්ය භාරයන් සහ වගකීම් සමඟින්, විවිධ පාර්ශවකරුවන් එක් කිරීමට අවශ්‍ය වේ:

| IDAT උපාය මාර්ගය සම්බන්ධ වගකීම් වගුව | | | | | | |
|---|---|---|---|---|---|---|
| # | ප්‍රමුඛතා කාර්යයන් | රජය | IDA | පෞද්. අංශය | අධ්‍යාපනික | ICTA |
| 1. | යටිතල පහසුකම් තිබීම (අවශ්‍ය යෙදවුම් සහිත අතේ ගෙන යා හැකි උපාංග, servers,ආදිය) | √ | √ | √ | | |
| 2. | ජාල සම්බන්ධතාවය සහ දැරියහැකි බව | √ | | √ | | |
| 3. | ගුණාත්මකභාවය සහ වලංගුභාවය සහතික කරන අතරම සැබෑ දත්ත සැපයීම | √ | | √ | | |
| 4. | කාලීන වශයෙන් දත්ත බෙදාගැනීම සඳහා දත්ත හුවමාරු ප්‍රොටෝකෝලවලට අනුගත වීම. | √ | √ | √ | | |
| 5. | දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් පවතින අධීක්ෂණ පද්ධතිවලට තොරතුරු සහ දත්ත ඇතුළත් කිරීම | √ | | | | |
| 6. | ව්‍යාපෘති කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්ක/පළාත්වලට ආදර්ශ නිලධාරීන් පත් කිරීම | √ | | | | |
| 7. | ධාරිතා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා පවතින යටිතල පහසුකම් සහ මූලපිරීම් සැපයීම | √ | √ | | √ | |
| 8. | අදාළ දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු කිරීම් සහ නිපුණතා වැඩසටහන් පැවැත්වීමෙන් සහාය වීම | √ | √ | √ | √ | √ |
| 9. | නියමු ව්‍යාපෘති සහ යෙදවීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම | √ | √ | √ | √ | √ |
| 10. | කෘෂි තාක්‍ෂණ වපසරිය තුළ ආරම්භක ව්‍යවසාය තෝරා ගැනීමට incubation සහාය (යටිතල පහසුකම්, පුහුණුව, ආදිය) පිරිනැමීම | √ | | √ | √ | √ |
| 11. | Incubation ක්‍රියාකාරකම් බිම් මට්ටමෙන් සිදු කිරීම සහ තිරසර කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම | √ | | √ | | |
| 12. | අනුකාරක ප්‍රයත්නයක් අඩු කිරීම සඳහා, පවත්නා ඩිජිටල් කෘෂි කාර්මික වැඩසටහන් සමඟ සැලසුම් කිරීමෙන් ප්‍රබල අභිසාරීතාවයක් සහතික කිරීම | | √ | | | √ |
| 13. | දැනුම හුවමාරු කිරීම සහ නවෝත්පාදනය සඳහා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ සම්බන්ධතා බිහි කිරීම | | | √ | √ | |
| 14. | ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීම කෙරෙහි කැපවීම | √ | √ | √ | √ | √ |
| 15. | ව්‍යාපෘතියෙහි මෙහෙයුම් කමිටු රැස්වීම් සහ අනෙකුත් අදාළ රැස්වීම් සැලසුම් කිරීම සහ ඒ සඳහා සහභාගී වීම. | √ | | | | √ |
| 16. | මූල්‍ය, කළමනාකරණ සහ පරිපාලන සම්පත් පිරිනැමීමෙන් ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ව්‍යාපෘති මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම | √ | | | | √ |

**රජය:**

- කෘෂි කර්ම අමාත්‍යාංශය සහ ඊට අදාළ ආයතන
- වාරි මාර්ග අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඇතුළු ඊට අදාළ ආයතන
- ධීවර අමාත්‍යාංශය සහ ඊට අදාළ ආයතන
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ඊට අදාළ ආයතන
- ඉඩම් අමාත්‍යාංශය සහ ඊට අදාළ ආයතන
- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ඊට අදාළ ආයතන
- තාක්ෂණ ආමාත්‍යාංශය හා ඊට අදාළ ආයතන
- **ජාත්‍යන්තර සංවර්ධන ආයතන (IDAs):** ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, FAO, USAID, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය, GIZ, ආදිය.
- **පෞද්ගලික අංශය:** විදුලි සංදේශ සමාගම්, කෘෂි වටිනාකම් දාමය හරහා ක්‍රියාත්මක වන සමාගම්, කෘෂි තාක්ෂණික සමාගම් ආදිය.
- **අධ්‍යාපනික :** පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, ආදිය.
- **ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)**

තවද, IDAT උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ දී පැවතිය හැකි අවදානම ඉවත් කිරීමේ අරමුණින්, ක්‍රියාත්මක කිරීමේ විවිධ අංශ හරහා අවදානම් සාධක හඳුනාගෙන ඇති අතර, අවදානම අවම කිරීමේ ක්‍රියා මාර්ග ද සකස් කර තිබේ.

වැඩසටහනේ ඉහත සඳහන් සියලුම අංග සඳහා සහය දැක්වීමේ පුළුල් ප්‍රවේශයක් මඟින් අපේක්ෂිත ඉලක්ක අර්ථවත් ලෙස ළඟා කර ගැනීම සහතික කෙරේ. මෙම IDAT උපාය මාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක් පහත දැක්වේ:

මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන අංග පහක් හඳුනාගෙන තිබෙන අතර, ඒවායේ ස්වභාවය අනුව, එම අංග ක්‍රියාවට නැංවීමේ දී ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය ඩිජිටල්කරණයට යෝග්‍ය මෙන් ම, ඩිජිටල්කරණය පිළිගන්නා පරිසරයක් ලෙස සකස් කිරීම සඳහා උත්ප්‍රේරක වශයෙන් බලපෑමක් ඇති කිරීමේ ඉඩකඩ පවතී. එමෙන් ම, ගොඩනගන ලද සහයෝගීතා සහ අභිසාරී මූලධර්ම මඟින් රජයේ / පෞද්ගලික අංශයේ / අධ්‍යාපනික / මූල්‍ය ආයතනවල අතිරේක වැඩසටහන් ද ක්‍රියාවට නැංවීමට ඉවහල් වනු ඇත. මෙමඟින් කුඩා පරිමාණ හා කෘෂි කර්මාන්තයේ නිරත, ඉතා සුළු වශයෙන් අවධානය හිමිවන ගොවීන් වෙත කෘෂි-උපදේශන,

**IDAT උපාය මාර්ගය සම්බන්ධ දළ විශ්ලේෂණය**




වෙළෙඳපොළ සඳහා  වඩා හොඳ ප්‍රවේශය, ණය ආධාර, ව්‍යවසායකත්ව අවස්ථා, තාක්‍ෂණය හා අනුගත වීම යනාදිය සම්බන්ධයෙන් වඩාත් සුබවාදී ප්‍රතිඵල ළඟා කර දේ.

මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන අංග පහක් හඳුනාගෙන තිබෙන අතර, ඒවායේ ස්වභාවය අනුව, එම අංග ක්‍රියාවට නැංවීමේ දී ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය ඩිජිටල්කරණයට යෝග්‍ය මෙන් ම, ඩිජිටල්කරණය පිළිගන්නා පරිසරයක් ලෙස සකස් කිරීම සඳහා උත්ප්‍රේරක වශයෙන් බලපෑමක් ඇති කිරීමේ ඉඩකඩ පවතී. එමෙන් ම, ගොඩනගන ලද සහයෝගීතා සහ අභිසාරී මූලධර්ම මගින් රජයේ / පෞද්ගලික අංශයේ / අධ්‍යාපනික / මූල්‍ය ආයතනවල අතිරේක වැඩසටහන් ද ක්‍රියාවට නැංවීමට ඉවහල් වනු ඇත. මෙමඟින් කුඩා පරිමාණ හා කෘෂි කර්මාන්තයේ නිරත, ඉතා සුළු වශයෙන් අවධානය හිමිවන ගොවීන් වෙත කෘෂි-උපදේශන, වෙළෙඳපොළ සඳහා  වඩා හොඳ ප්‍රවේශය, ණය ආධාර, ව්‍යවසායකත්ව අවස්ථා, තාක්‍ෂණය හා අනුගත වීම යනාදිය සම්බන්ධයෙන් වඩාත් සුබවාදී ප්‍රතිඵල ළඟා කර දේ.